# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 518/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 25/03/2024 පැය 0540

## මාධ්‍ය නිවේදනය

**සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.03.19 වන දින සිට බස්නාහිර පළාත හා දකුණු පළාත මූලික කර ගෙන ක්‍රියාත්මක සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි විශේෂ පොලිස් කණ්ඩායම් 20 ක් යොදවා මෙහෙයුම් ආරම්භ කරන ලදී.

- 2024.03.24 වන දින දහවල් කාලයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත කොටහේන පොලිස් වසමේ සුමිත්‍රාරාම පාර ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 මිලිග්‍රෑම් 168 ක් සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

  **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන කොටහේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

- 2024.03.24 වන දින සවස් කාලයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත බොරැල්ල පොලිස් වසමේ සිරිසර උයන මහල් නිවාස අසලදී වැටලීමක් සිදුකර **සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු හෙරොයින් ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 230 ක් සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

  **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධව කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.**

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**